





# අපේ බීජ-අපේ පොහොර වලින්

# බිම්මල්-එළවළු වගාකර පැකට් කර වෙළෙඳ පොළට ගෙනෙන

# පිළියන්දල ජානකී






## ගබඩා කරන්නෙත්-වෙළෙඳපොළට ගෙනෙන්නේත් වායුසමීකරණ පහසුකම් යටතේ

බොහෝදුරට මිනිසුන් ව්‍යාපාර කරනුයේ තම සුබසෙත සඳහා ය. තම සුබසෙත මෙන්ම අන් අයටත් ඉන් ප්‍රයෝජනයක් වන අයුරින් ව්‍යාපාරයක් කරන්නේ නම් ඒ කලාතුරකින් අයෙකි. එලෙසින් රටටත් තමන්ටත් අභිවෘද්ධියක් වන පරිදි ව්‍යාපාරයක නිරතව සිටින කාන්තාවකි ජානකී කත්‍රිආරච්චි.

**★ කොහොමද ඔබේ ව්‍යාපාරයේ තොරතුරු?**

මං ගොටුකොළ, මුකුණුවැන්න, කංකුන්, කතුරුමුරුංගා, සාරණ, තම්පලා, කීර සහ මුං බීජ, බිම් මල් වගේ දේවල් හෝදලා කපලා පැකට් කරන එක තමයි මුලින්ම කළේ. අපි මේ දේවල් වගා කරලා කඩලා අරගෙන හොඳට පිරිසුදු කරනවා. ඊට පස්සේ තමයි පැකට් කරන්නෙ.

ලංකාවේ අය අද තියෙන ආර්ථික තත්ත්වය නිසා හරි කාර්යබහුලයි. මැල්ලුම් වගේ දේවල් හදාගන්න වෙලාවක් නැහැ. ඒනිසා මට අවශ්‍ය වුණේ ඒ අයට පහසුවෙන් මැල්ලුමක් හදාගන්න ක්‍රමයක් හොයාගන්න. මෙම එළවළු නිෂ්පාදනය කරන්නේ අපි අපේ සාම්ප්‍රදායික වගා ක්‍රම පාවිච්චි කරලා. අපේ ගොවිපොළ තියෙන්නේ හරිම ස්වභාවික පරිසරයක අපි වගාව පරිස්සම් කරගන්නේ පරිසරය සමතුලිත කරලා. අද තියෙන රසායනික



පොහොර යෙදීමෙන් පසේ ඉන්න පනුවෝ මැරෙනවා. පසේ ඉන්න සත්තු පසට හිතකරයි. ඒනිසා අපි ගොම දියර, කොම්පෝස්ට් වගේ පොහොර පාවිච්චි කරනවා.

හොඳ පොළොවක් අපට තියෙනවා. අපේ අය කරන්නේ ඒ පොළොවට වස දාලා විනාශ කරන එක. අපි කෘමිනාශක යොදන්නේ නැතිව පැළෑටි වර්ධනය සඳහා දියර පොහොර භාවිතා කරනවා.

**★ ඔබට වගාවට අවශ්‍ය බීජ ලබාගන්නේ කොහොමද?**

අපේ සියලුම බීජ දේශීයයි. පිටරටින් ජාන වෙනස් කොට ගෙනෙන බීජ අපි පාවිච්චි කරන්නේ නැහැ.

**★ කොහොමද ඔබේ ව්‍යාපාරයේ පැකට් කිරීම් අංශය ක්‍රියාත්මක වෙන්නේ ?**

අපි එළවළු සියල්ල කපලා අපේ ව්‍යාපාරික ස්ථානයට රැගෙන එනවා. එහි වැඩ කරන අය ගහෙන් ගහ සුද්ධ කරනවා. කහපාට වෙච්ච කොළ ඉවත් කරනවා. දින 10ක් තබාගත හැකි කොළ පමණයි අපි ගන්නේ. ඒ ටික පස් සැරයක් පමණ අපි සෝදා පිරිසුදු කරගන්නවා. අවසාන වතුර භාජනය බලලා එය කුණු නම් නැවත සෝදනවා. පසුව වේලා ගන්නවා. ඊට පස්සේ හීනියට කපනවා. ඒ සඳහා කපන අංශය වෙනම ඉන්නවා. ඒ අංශය AC කරලා ශල්‍යාගාරයක් වගේ තියෙන්නේ. ඇතුළට කිසිම විෂබීජයක් නොයන ආකාරයට එය සකසා තියෙනවා. අපි මේ එළවළු, පලා ගස් තබා ගැනීම සඳහා කිසිම රසායනික ද්‍රව්‍යයක් පාවිච්චි කරන්නේ නැහැ. පිරිසිදුකම මගින් තමයි අපි කල් තියාගන්නේ. ඒ වගේම පැකට් AC වාහනවලම තමයි ප්‍රවාහනය කරන්නේ. ඕනෑම උසස් වෙළඳ ආයතනයකින් ලබාගන්න පුළුවන්.

**★ කොහොමද ඔබ මේ ව්‍යාපාරය පටන් ගත්තේ?**

අපි පටන් ගත්තේ බිම් මල් මගින්. පසුව තමයි අනෙක් පළා, එළවළු ආදිය නිෂ්පාදනය කළේ. මේ මැල්ලුම් පැකට් සඳහා අවශ්‍ය තාක්ෂණය හොයන්න හැමතැනම ගියා. ඒත් කවුරුවත් දැනගෙන හිටියේ නැහැ. මේ විදියට පලා පැකට් කිරීම අපි තමයි මුලින්ම ආරම්භ කළේ. එය කරලා බලලා අත්දැකීමෙන් හොයාගත්තේ. ටිකෙන් ටික කරලා දැන් ලංකාව පුරාම යවනවා.

**★ ඔබ මේ පිළිබඳ අධ්‍යාපනය හැදෑරුවේ කොහොමද?**

මම දැන් ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යවසායකත්ව අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂිකාවක්. එහිදී ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය දේ ඉගැන්වීම කෙරෙනවා. එය මගේ ජීවිතයට අලුත් පිටුවක්. මම මගේ ව්‍යාපාර කටයුතු අද්දැකීම්වලින්ම ඉගෙන් ගත් දේවල්.

**ඔබේ ව්‍යාපාරයට මේ සඳහා ලැබිලා තියෙන තත්ත්ව සහතික මොනවාද?**

SLI (GMP) සහතිකය ගත්ත ලංකාවේ පළවෙනිම ආයතනය අපි. ශීඩ තත්ත්ව සහතිකයට අවශ්‍ය අයුරින් අපි මේ හැම දෙයක්ම කරන්නේ. ඊට අමතරව අපිට 100% Organic සහතිකය ලැබිලා තියෙනවා.

ජානකී කත්‍රිආරච්චිගේ ව්‍යාපාර කටයුතු සඳහා සිරිකතින් සුබ පැතුම්. ඇගේ දුරකතන අංක 0112613613, 0112616060.

දාම්පේ - පිළියන්දල

සටහන - ඉනෝකා මිණිපළඟ





